**2024-07-15 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

## 01. ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ජාතික ප්‍රතිපත්තිය 2024-2034

2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධිත) පනතින් සංශෝධිත 1961 අංක 31 දරන ආයුර්වේද පනත මගින් රට තුළ දේශීය වෛද්‍ය ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ නීතිමය රාමුව සපයා තිබේ. එහෙත්, දේශීය වෛද්‍ය සේවාව සඳහා රජයේ ප්‍රතිපත්තිමය දිශානතිය මෙහෙයවන තනි ජාතික ප්‍රතිපත්තියක් මෙතෙක් සම්පාදනය වී නොමැත. වත්මන් සේවා සැපයීමේදී මතුව ඇති ගැටලු නිරාකරණය කර ගැනීමට සහ දේශීය වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම තුළින් අනාගත පරම්පරාවට ගුණාත්මක හා ශක්තිමත් වෛද්‍ය ක්‍රමයක් තිළිණ කිරීම සඳහා ප්‍රධාන ධාරාවේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ දේශීය වෛද්‍ය ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව පැන නැගී ඇත. ඒ අනුව, විද්වත් මණ්ඩලයක් විසින් පුළුල් සහභාගිත්ව ක්‍රියාවලියක් හරහා සකස් කරනු ලැබ ඇති ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ජාතික ප්‍රතිපත්තිය 2024-2034 ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 02. උපාධි පිරිනැමීමේ ආයතන වෙත විදේශීය ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම සඳහා පහසුකම් සැලසීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල 17හි විදේශීය ශිෂ්‍යයින් සඳහා 5%ක ප්‍රතිශතයක් මේ වන විට වාර්ෂිකව වෙන් කරනු ලැබේ. ඊට අමතරව, විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය මඟින් පිළිගෙන ඇති උපාධි පිරිනැමීමේ ආයතන 26 සඳහා ද විදේශීය ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම මඟින්, ශ්‍රී ලංකාව ආසියාවේ දැනුම් කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමේ අරමුණ ඉටු කර ගත හැකි බව හඳුනාගනු ලැබ ඇත. නමුත්, එක් එක් රටවල් විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බලනු ලබන පිළිගත් අවම සුදුසුකම්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක යම් උපාධියක් සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකමක් වශයෙන් අනුකූල කර ගැනීමට ඇති හැකියාව නිර්ණය කර ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 193හි, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා



163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

භාවිත කරන අවම සුදුසුකම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතන මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීමේ අවම සුදුසුකම ලෙස සැලකීමටත්, එකී සුදුසුකම් මගින් අනාවරණය නොවන ව්‍යතිරේක අවස්ථා සඳහා UK NARIC ආයතනය වෙතින් සනාථ කර ගැනීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත නිවාස ව්‍යාපෘතියක් සඳහා කැලණිය, වෙදමුල්ල පිහිටි ඉඩමක් එච්.එම්.කේ. ප්‍රොපටි ඩිවෙලොපර්ස් (පෞද්ගලික) සමාගම වෙත ලබා දීම**

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු කැලණිය, වෙදමුල්ල පිහිටි අක්කර 12ක පමණ ඉඩමක් එච්.එම්.කේ. ප්‍රොපටි ඩිවෙලොපර්ස් (පෞද්ගලික) සමාගම වෙත ලබා දීමට අනුමැතිය ලබා දීම පිණිස ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටු රැස්වීමේදී මීට පෙර අනුමැතිය ලබා දී ඇත. එහෙත්, අදාළ එකඟතාවන්ට අනුගතව කටයුතු කිරීමට එකී සමාගම අපොහොසත් වීම හේතුවෙන් අදාළ ඉඩම් කොටස එම සමාගම වෙත ලබා දීමට මෙතෙක් පියවර ගෙන නොමැත. එකී ඉඩමේ අදියර 03ක් යටතේ නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ඉඩම් කොටස ලබා ගැනීම පිණිස එච්.එම්.කේ. ප්‍රොපටි ඩිවෙලොපර්ස් (පෞද්ගලික) සමාගම විසින් නැවත ඉල්ලීමක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගනු ලැබ ඇති අක්කර 08 - රූඩ් 02 - පර්චස් 16.26ක ඉඩම් කොටසක් රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වර්තමාන තක්සේරුව මත පදනම්ව එකී සමාගම වෙත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **කැලණිය, මුදුන් ඇල ප්‍රදේශයේ පිහිටි ඉඩම් කොටසක් Storight Logistics (Pvt) Ltd වෙත බදු දීම**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය මත සැපයුම් සේවා හා ගබඩා පහසුකම් වෙනුවෙන් කොළඹ වරායට ආසන්නයේ පිහිටා ඇති ඉඩම් කොටසක් ලබා දෙන ලෙස Bitsuthra IT (Pvt) Ltd විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එකී සමාගම විසින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනාව අදාළ මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බැවින්, ආයෝජන මණ්ඩලයේ විධිවිධාන අනුව, Storight Logistics (Pvt) Ltd නමින් නව සමාගමක් ස්ථාපිත

කර තිබේ. කැලණිය, මුදුන් ඇල ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු අක්කර 02 පර්චස් 1.08ක ඉඩම් කොටසක් එකී ව්‍යාපෘතිය සඳහා සුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, එකී ඉඩම් කොටස රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත පදනම්ව Storight Logistics (Pvt) Ltd වෙත වසර 30ක කාලයක් සඳහා බදු පදනම මත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා ගාස්තු සමාලෝචනය කිරීම පිණිස ගාස්තු ප්‍රතිපත්තිය සහ සූත්‍රය ක්‍රියාත්මක කිරීම**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නව ගාස්තු ප්‍රතිපත්තිය සහ සූත්‍රය 2024-04-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලද අතර, එහිදී අදාළ සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කර අවශ්‍ය සංශෝධන ඇතුළත් කරමින් නව ගාස්තු ප්‍රතිපත්තිය සහ සූත්‍රය ඉදිරිපත් කිරීමට නියම කර ඇත. ඒ අනුව සකස් කරනු ලැබ ඇති සංශෝධිත ජල ගාස්තු ප්‍රතිපත්තිය සහ සංශෝධිත ජල ගාස්තු සූත්‍රය 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම පිණිස ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පැමිණීමේ ප්‍රදේශයේ රේගු කටයුතු සඳහා වෙන් කර ඇති පෙදෙසේ ව්‍යවහාර මුදල් මාරු කිරීමේ කවුන්ටර ක්‍රියාත්මක කිරීම**

2024-01-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පැමිණීමේ ප්‍රදේශයේ රේගු කටයුතු සඳහා වෙන් කර ඇති පෙදෙසේ ව්‍යවහාර මුදල් මාරු කිරීමේ කවුන්ටර ක්‍රියාත්මක කිරීම සඳහා සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් සීමිත තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 05ක් ඉදිරිපත්ව තිබේ. එකී ලංසු ඇගයීමෙන් අනතුරුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත වසර තුනක (03) කාලසීමාවක් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* කවුන්ටර අංක 01 සම්පත් බැන්ක් පීඑල්සී වෙත.

* කවුන්ටර අංක 02 මහජන බැංකුව වෙත.

* කවුන්ටර් අංක 03 කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත.

* කවුන්ටර් අංක 04 තෝමස් කුක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත.

* කවුන්ටර් අංක 05 ලංකා බැංකුව වෙත.

07. **සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සේවයේ ස්වයංක්‍රීය ආකාරයෙන් ඉහළ පෙළ ආසන වෙන් කිරීම සඳහා ලංසු තැබීමේ සේවා සහ ඒ ආශ්‍රිත අනුයාත සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

ස්වයංක්‍රීය ආකාරයෙන් ඉහළ පෙළ ආසන වෙන් කිරීම සඳහා ලංසු තැබීමේ සේවා සහ ඒ ආශ්‍රිත අනුයාත සේවා සඳහා සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් වර්තමානයේ Plusgrade පද්ධතිය උපයෝගී කරගනු ලබයි. ව්‍යාපාරික පංතියේ වෙන් කර නොගත් ආසන පවතින අවස්ථාවේදී පිරිමැසුම් පංතියේ ගුවන් ටිකට්පතක් හිමි මගියෙකුට ව්‍යාපාරික පංතියේ ටිකට්පතක් ලබා ගැනීම සඳහා ලංසු තැබීමේ අවස්ථාව සැලසීම මඟින් ගුවන් සේවාව සඳහා ආදායම් මට්ටම ඉහළ නැංවීම මෙම සේවය ඔස්සේ සිදුවේ. මෙම සේවාව පවත්වාගෙන යාම සඳහා ජාත්‍යන්තර තරගකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 02ක් ලැබී ඇත. එම ලංසු ඇගයීමෙන් අනතුරුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සේවය සඳහා ස්වයංක්‍රීය ආකාරයෙන් ඉහළ පෙළ ආසන වෙන් කිරීම සඳහා ලංසු තැබීමේ සේවා සහ ඒ ආශ්‍රිත අනුයාත සේවා කොන්ත්‍රාත්තුව Plusgrade Inc වෙත වසර 05ක කාලසීමාවකට පිරිනැමීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ගොඩගම-හෝමාගම මාර්ගයේ අඩක් නිම කරනු ලැබ ඇති I කොටසේ වැඩ නිම කිරීම සඳහා සංවර්ධනය සඳහා වන සෞදි අරමුදලේ අරමුදල් වෙන් කර ගැනීම**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුරිංචාකේණි පාලම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස සංවර්ධනය සඳහා වන සෞදි අරමුදලේ අරමුදල් භාවිත කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිම කිරීමෙන් පසුව තවදුරටත් ඇමෙරිකානු ඩොලර් මිලියන 10.5ක පමණ ණය ශේෂයක් පවතින අතර, එම ණය ශේෂය ගොඩගම-හෝමාගම මාර්ගයේ අඩක් නිම කරනු ලැබ ඇති I කොටසේ වැඩ නිම කිරීම සඳහා යොදා ගැනීමට තීරණය කර තිබේ. එම මාර්ගයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 12ක අරමුදල් අවශ්‍ය වන අතර, ඒ සඳහා අවශ්‍ය ඉතිරි ඇමෙරිකානු ඩොලර් මිලියන 1.5ක මුදල සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ ණය මුදලින් ලබා දීමට සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල එකඟතාව පළ කර ඇත. ඒ අනුව, අරමුදල් සලසා ගෙන ගොඩගම-හෝමාගම මාර්ගයේ අඩක් නිම කරනු ලැබ ඇති I කොටසේ වැඩ නිම කිරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **නානුඔය දුම්රිය ස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අරමුදල් භාවිත කරමින් නානුඔය දුම්රිය ස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2023-04-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ගණන් සංශෝධනය වීම මත නානුඔය දුම්රිය ස්ථානය නවීකරණය සඳහා වන රුපියල් මිලියන 74.63ක ගිවිසුම්ගත වටිනාකම රුපියල් මිලියන 101.81 දක්වා ඉහළ ගොස් තිබේ. ඒ අනුව, නව සංශෝධිත ඇස්තමේන්තුව යටතේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) මඟින් අදාළ නවීකරණය කිරීමේ කටයුතු නිම කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය අතිරේක මුදල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙතින් සලසා ගැනීමටත් සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ජාතික තරුණ සේවා සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන SMART Youth Exhibitions & Nights - 2024 වැඩසටහන දිප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම**

2019 වර්ෂයේ සිට වසර දෙකක් පුරාවට ගෝලීයව පැතිර ගිය කොවිඩ් වසංගතයේ ප්‍රබල බලපෑම මත සංචරණය, අන්‍යෝන්‍ය සබඳතා, පුද්ගල හමුවීම් සහ කණ්ඩායම් වශයෙන් රැස්වීම සීමා වීම මත අතිශය පීඩාකාරී තත්ත්වයකට මුහුණ දීමට තරුණ ප්‍රජාවට සිදු විය. ඔවුන් එකී පීඩනයට නතු වීම වළකමින් ඔවුන්ගේ විනෝදාස්වාදය, රසවින්දනය සහ මානසික සුවතාව වර්ධනය කිරීමත්, තරුණ ප්‍රජාවට සමාජශීලී සබඳතා භෞතිකව පවත්වාගැනීමට අවස්ථාව සලසා දීමත්, ඔවුන්ට එක්ව කටයුතු කිරීමට අවස්ථාව සලසා දීමත් ඉලක්ක කර ගත් රසවින්දනාත්මක වැඩසටහන් දිවයින පුරා පැවැත්වීම යෝග්‍ය බව පෙනී ගොස් ඇත. ඒ අනුව, මුළු දිවයිනම ආවරණය වන පරිදි SMART Youth Exhibitions & Nights - 2024 වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය බෙහෙත් ඉඟුරු සපයා ගැනීම**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව නිෂ්පාදනය කරනු ලබන ඖෂධ වර්ග 87ක් සඳහා බෙහෙත් ඉඟුරු අමුද්‍රව්‍යයක් ලෙස භාවිත කරනු ලබන අතර, මේ වන විට වෙළෙඳපොළේ බෙහෙත් ඉඟුරුවල දැඩි හිඟයක් පවතී. ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරනු ලැබ ඇති බෙහෙත් ඉඟුරු ටොන් 50ක ප්‍රමාණයක් පවතින අතර, එකී බෙහෙත් ඉඟුරු තොගය සහනදායී මිල ගණන් යටතේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලබා ගැනීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **සත්ත්ව සුබසාධන පනත් කෙටුම්පත සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් යෝජිත සංශෝධන සඳහා අනුමැතිය ලබා ගැනීම**

සත්ත්ව සුබසාධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා 2022-01-10 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර, ඒ අනුව, එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ ආහාර සුරක්ෂිතතා හා කෘෂිකර්ම ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇති අතර, එම කාරක සභාව විසින් එකී පනත් කෙටුම්පත සඳහා සංශෝධන

කිහිපයක් යෝජනා කර ඇත. එම සංශෝධන එකී පනත් කෙටුම්පත සඳහා වන පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කර ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ද ලැබී තිබේ. ඒ අනුව, අදාළ සංශෝධන සත්ත්ව සුබසාධන පනත් කෙටුම්පත සඳහා වන පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතට සංශෝධන හඳුන්වා දීම**

ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වගන්තිය යටතේ ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුවන් මුහුණ දෙන ගැටලු මගහරවා ගැනීම පිණිස එම පනත සංශෝධනය කිරීම සඳහා 2024-03-18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලැබී තිබේ. එම පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ (ආ) ඡේදයෙහි සඳහන් "සාවුරුද්දක් ඉක්මවා" යන වචන වෙනුවට "වසර පහක් ඉක්මවා" යන වචන ආදේශ කරමින් 83 ව්‍යවස්ථාවේ (ආ) ඡේදය සංශෝධනය කිරීම පිණිස 2024-07-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රතිපත්ති අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා; සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **කෘෂිකර්ම නවීකරණ වැඩසටහන**

කෘෂිකර්ම නවීකරණ වැඩසටහනේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම සඳහා 2024-03-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම වැඩසටහනේ දෙවන අදියර වශයෙන් සෑම දිස්ත්‍රික්කයකම තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 බැගින් තෝරාගෙන කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබ තිබේ. ඒ අනුව, එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රුපියල් මිලියන 10 බැගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 75ක් සඳහා 2024 අයවැය මඟින් වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 750ක් යොදා ගනිමින් කෘෂිකර්ම නවීකරණ වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **ශ්‍රී ලංකාවේ සත්‍යය, එකමුතුකම සහ සංහිඳියාව පිළිබඳ කොමිෂන් සභා පනත් කෙටුම්පත**

ශ්‍රී ලංකාවේ සත්‍යය, එකමුතුකම සහ සංහිඳියාව පිළිබඳ කොමිෂන් සභා පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා 2023-12-18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඉන් අනතුරුව විවිධ පාර්ශ්වයන් විසින් එකී පනත් කෙටුම්පත සඳහා තවදුරටත් සංශෝධන යෝජනා කිරීම හේතුවෙන් එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොමැත. සත්‍යය සහ සංහිඳියා යාන්ත්‍රණය සඳහා වූ අතුරු ලේකම් කාර්යාලය විසින් උපදේශන වට කිහිපයක් පවත්වා අදාළ පනත් කෙටුම්පතට සිදු කළ යුතු සංශෝධන හඳුනා ගනු ලැබ ඇත. එකී සංශෝධන ද ඇතුළත් කර සකස් කරනු ලැබ ඇති මූලික කෙටුම්පත මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත්, මීට පෙර අදාළ පනත් කෙටුම්පත ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරනු ලැබ ඇති ගැසට් නිවේදනය අවලංගු කිරීමටත් ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා; අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා; සහ විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **විනිමය බිල්පත් ආඥාපනත සඳහා සංශෝධන හඳුන්වා දීම**

1927 අංක 25 දරන විනිමය බිල්පත් ආඥාපනතේ ඇති යල් පැන ගිය විධිවිධාන සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම සඳහා 2024-01-24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා; සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත සංශෝධනය කිරීම**

1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත යටතේ ස්ථාපිත කර ඇති ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ තුළ කටයුතු කරනු ලබන ප්‍රමුඛතම ආයතනයක් වන අතර, රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත වාණිජ බැංකුවක් ලෙස ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා සුවිශේෂ දායකත්වයක් ලබා දෙනු ලබයි. තරගකාරී සහ වේගයෙන් වෙනස් වන මූල්‍ය වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වෙමින්, ප්‍රශස්ත ප්‍රතිලාභ උපයා ගැනීම සීමා කරනු ලබන අවහිරතා සහ අභියෝග ගණනාවක් දැනට බලාත්මක එකී ආඥාපනත තුළ පවතින බව හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් සංශෝධනය කිරීම සඳහා සකස් කරනු ලැබ ඇති මූලික කෙටුම්පත මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

19. **2024 අංක 2 දරන කොළඹ වරාය නගරය (ගාස්තු) නියෝග - (විෂය අංක 43)**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධාන පරිදි 2024-06-06 දිනැති ගැසට් නිවේදනය මඟින් 2024 අංක 2 දරන කොළඹ වරාය නගරය (ගාස්තු) නියෝග පනවනු ලැබ

තිබේ. එම පනතේ 71 වගන්තියේ විධිවිධාන පරිදි එලෙස පනවනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මාස 03ක් ඇතුළත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ අනුව, අංක 2387/38 හා 2024-06-06 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත 2024 අංක 2 දරන කොළඹ වරාය නගරය (ගාස්තු) නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**20. අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සඳහා සංශෝධන (දඩ මුදල් වැඩි කිරීම)**

අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් දඩ මුදල් වර්තමාන මුදල් අගය මත පදනම්ව වැඩි කිරීමට හැකි වන පරිදි අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස 2023-11-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති සංශෝධිත පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**21. 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම**

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඇතුළු වෙනත් නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා ක්‍රියාත්මක වන දේශීය නීතිය සවිබල ගැන්වීම සඳහා සමාගම් පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇති අතර, ඒ අනුව එකී පනත සංශෝධනය කිරීම පිණිස 2024-07-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී සංශෝධන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ඉන් අනතුරුව, අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**22. සුරක්ෂා සිසු රක්ෂණාවරණය - 2024**

සුරක්ෂා සිසු රක්ෂණාවරණය වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීම සඳහාත්, ඒ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් මිල ගණන් කැඳවීමටත් 2024-05-06 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති මිල යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් ඇගයීමට ලක් කර 2024/2025, 2025/2026 සහ 2026/2027 යන වර්ෂයන් සඳහා සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන රුපියල් බිලියන 6.027ක (වැට් රහිත) මුදලකට ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර ඇත. ඒ අනුව, ඉහත සඳහන් පරිදි වසර 03ක කාලයක් සඳහා සුරක්ෂා සිසු රක්ෂණාවරණය සඳහා වන කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත ප්‍රදානය කිරීමටත්, සුරක්ෂා සිසු රක්ෂණාවරණයේ ජීවිත රක්ෂණාවරණය යටතේ වාර්ෂික ආදායම රුපියල් 180,000කට අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට හිමි දෙමාපිය මරණ ප්‍රතිලාභ "අස්වැසුම" වැඩසටහනට අයත් පවුල්වල සිසුන්ට ද ලබා දීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********